# පැරකුම්බා සිරිත



සංස්කරණය

සිරි තිලකසිරි

# පැරකුම්බා සිරිත

1. පිහිටි කුලුණු’ඹ    තුර
දහම් මුවරඳ රස    බර
සෙවි සුර නර    බමර
වඳිම් මුනිරජ තඹර    සිරිසර

2. මුනි මුව’ගින්    පහළ
මහ සිලිල පල    සිහිලළ
පිවිතුරු මොක්    වෙරළ
වඳිම් අදරින් දහම් ගඟ    ලෙළ

3. පෙළ දම් මියර    යුත
මුහු කළ සිල් දියෙන්    පත
මගපල කරල්    ගත
වඳිම් මහසඟ පවර    පින්කෙත

4. ස ත ත  සක සක    අත
නිනෙත  ගජවත    බරනෙත
ත ල ත  ගුරු කිවි    නත
ස ත ත  සළසත් මෙදුර සත    සෙත

5. කළොත් ගුරු    සේ වේ
සුවඳ පත නළ    සේ වේ
නොමැ කැරූ එ    සේ වේ
බැඳුමැ කවිනළු බස්    කෙ සේ වේ

6. මහත වියතුන් බස
නොදැනත් ඇසුව වේ තොස
දසමන් මල් රැස
නොසිඹැ දුටුවත් දැනේ ඇති ලෙස

7. වියතුන් ඉදිරියේ
නොහොබී කුකිවි දිරියේ
දිවයුරු ඉදිරියේ
කෙසේ බැබළෙද කණමැදිරියේ

8. පැහැය සුදු නිල් රතු
ඇසටමැ පැනේ සිත් යුතු
තෙපලනු කිමැ අමුතු
දනිත් නුවණැතියො කිවිබස තතු

9. අතුරු කප පෙර උපන් බඹපුත් විවස්වත්
මනුරජකුලෙන් පත
ඔකාවස් පුතු බානු මන්දතු පසේනදි සුදසුන්
බගීරත
නහුස සංකති රගු දිලීප තිසංකු නල නාබාග
දසරත
රාම ලක්මණ කුස ලවාදි පසිඳු සක්විති රජුන්
ගෙන් යුත

10. දහම් සෝ රජ සසිරි මාබෝ දකුණු සාකා
එවත මෙලකට
උතුම් තම කුලෙනෙවී සුමිතුරු කුමරු සමහින්
කුලන් දස අට
දකිම් නී උන් දෙවනපැතිස් ලකිසුරා සෙද
පෙරගමන් කොට
වැඩුම් කැරැ ඒ දුමිඳු අනුරාපුර වෙතෙයි පුද
පෙරහරින් තුට

11. එකල එනිරිඳු සුමිත් කුමරුන් පලදවා
මිණිවොටුනු පිවිතුරු
උදුල සත් මඟුලැතුපිටින් පුර වැඩම කරවා
පුදෙන් විසිතුරු
නිමල කුල පරපුරෙන් එන ලෙස දෙමින්
ජයමහලැන තනතුරු
විපුල අදරින් සැලසි දුමිඳුන් පුදසිරිත්
කරවනුව නිරතුරු

12. මෙලක රජ කළ පවර ගජබා නිරිඳු මාවටුපුරෙන්
සොළි රට
එකල සැටවස් පුරා ගෙනැ ගිය දොළොස් දහසක්
දනන් සිර කොට
අසා රුහැණිවැ ගදා ගෙනැ පසළොස්රියන් තුන්රියන්
දිග වට
මුද පීනා උරතලෙයි ගෑ සඳුන් නොමකා
ගොසින් එතෙරෙට

13. පි වි ස සොළිපුර එරජගෙට ගොස් සමහ ඔහු
සිහසුනේ උන් සඳ
මෙ ලෙ ස සිහළිඳු තනිවැ ආයේ කිමැයි පුළුවුත් සෙමෙන්
සොළි රද
දොළොස දහසක් පෙරප නුවරින් දනන් ගෙනැ ආ
නුඹගෙ පිය රද
නො ල ස ගෙනැ යන ලෙසට ආමැයි කියත තෙපුලක්
වෙමින් වැඩි ඔද

14. නිරිඳ සී සී කියනු කිමැ බස් මෙසේ නොතකා
අප සොළින් මැද
තවද වැලි මැඩැ තෙල් යපූ දිය ගතැකිදෝ කවුරුන්
විසින් තද
එසඳ සොළියා බසට රුහැණිවැ ගදා මිරිකා
රුපැයි දියකඳ
පැහැද දුන් අඩු නොවැ ගෙනායේ සුවිසි දහසක්
දනන් නොවරද

15. රජෙක් සිරිසඟබෝ නමින් යුත් තවට වල වැදූ පවට බා
උදක් මෙත් සිත වෙමින් උන්නේ, එකලැ
නරනිඳු ගොළුඅබා
යමෙක් ඔහු සිර ගෙනා නම් දෙන ලෙසට
දහසක් රන් තබා
එවක් අණබෙර ලැවී රට ඒ අසා බැළයෙක් දන ලො බා

16. ගොසින් වල වන් නිරිඳු දිටි එද අසා ඔහුගෙන්
රට පවත්
තොසින් සිය සිර ඔහුට දන් දිනි, එහිස දෙස් කී
ගිය තැනත්
රිසින් බුදුබව ලබනු බුදුකුරු දහම්
සපයන එබෝසත්
යසින් සිරිසඟබෝ නමින් දන් ලියති වණුවක්
රජ මහත්

17. තෙදින් මහසෙන් නැමැති මහසෙන් රජෙක් දේනා
වෙහෙර'නුරපුර
රියන් සතලිස් තුරා සියයක් කරවමින්
මහසැයක් මනහර
බදුන් ගුණ සලකා පටී දා සුරපුරෙන් බසිවයි
ඉටන් කැර
ඉදින් නොවැඩිය රහ බොමැයි රහ චිත අතින් ගෙනැ
සිටිය එමෙවර

18. වි  දා ගෙනැ උන් සුරිඳු නුබගබ ලඹ පටී දා
එනරනිඳු දක
මු  දා රාවිත සුවඳ සිපිලෙන් දෙවැ තමා සුබ
ලකුණු අත් දෙක
එ  දා අල්වත අසුරියනක් පමණ දුරු කැරැ
නැඟී සහසක
යොදා උකුළේ තුබු සිරියැඳ ගෙනැ කැපී පැනැ ඉන්
අඩක් එක

19. වි සේ සවැ ලක මිඳු මාහිමි පුද සිරිත් පැවැතෙන සඳා
දෙ සේ කලිහෙක් වඩා සපැමිණි දකුණු දළදා වැඳැ පුදා
උ සේ සත්මහලින් අලුත් ලෝමහපහා[2] කැරැ මනනඳා
මෙසේ තෙදියත පසිඳු වී කිත්සිරි මෙවන් නරනිඳු සඳා

20. විසූ නාලොවැ පවා නයිඳුන් නිරෝ කැරැ ලැබැ මිණි මනා
මුසු කරුණා නුවණ ගුණයෙන් සතන්හට මවු පිය මෙනා
අසූ මහසවු නම් තබා කුමරුන් අසූවක් ලැබැ ගෙනා
අසූ වක් හවුරුදු කෙළේ රජ බුජස් රජ ලෝවැඩ තනා

21. දෙටු පතිස් රජ අනඳ හිමි රුව රනින් කැරැ
රතයක වඩා
ඉටු මෙතුන්රජයේ සඟුන් සහ රුවන් පිරිතින්
පැන් වඩා
පටු න වේ මැඳ ඇවිදැ රෝ දුක් දුබික් බිය දුරු
කැරැ වඩා
තුටු කෙළේ ලක කලට මහමේ වස්වමින්
දිය සෙත් වඩා

22. වියත් සිළුමිණි ඇදුරු බුදුගොස් මහතෙරුන්හට
දඹදිවින් වැඩී
මහත් වෙහෙරක් රනින් කරවා දෙමින් තෙකෙළක්
පමණ අඩු වැඩී
සුගත් හට මෙන් පුදා වැඳැ නිති ලියවමින් අටුවා
දහම් වැඩී
දිගත් හෙබවී යසින් මහනම් සිරිනිවෙස් නම් නිරඳු
ඔද වැඩී

23. වෙහෙ ර දසටක් පුරා කරවා දහඅටක් මහ වැව් බැඳී
ව ස ර එකදා බිසව් අබිසෙව් මහණුවම් තෙමඟුල් යෙදී
ඈ ජ ර කිවියර පිනින් ජානකිහරණ ඈ මහකව් බැඳී
කු ම ර දස් රජ කාලිදස් නම් කිවිඳුහට සිය දිවි පිදී

24. ඉමල් හල මුනි ලෙසින් වදහළ මෙලක රකිනුව
මෙත් සිතින්
උපුල් වන් දෙව් රජුන් පිළිරුව වඩිනු දැක මහසයුරතින්
විමල් ගුණ යුත් නමින් දාපුළුසෙන් රජෙක් ආ
එමොහොතින්
විපුල් සිරි දෙව්නුවර කරවා පිහිට කැරැවී යහපතින්

25. සසිරි මානාවුලුපුරෙයි ඉඳු පරපුරෙන් ආ පරසිදූ
සොළින් වසහවැ තුබූ රට ගෙන සයානුවක් අවුරුදූ
මුනිසසුන් ලක වවා අමුතු වැ මනුරජෙව් පිළිවෙළ සැදූ
එසිරිසහබෝ විජයබා රජ විසී පස්පනසවුරුදූ

26. පොලොන් නරු පුර එපැරකුම්බා නිරිඳු ලක
එකසත් කැරා
ගො සි න් අරමණ සොළී පඩිරට රැගෙන යුදයෙන්
යස පුරා
යෙ හෙ න් දෙදහස් පන්සියක් මහවෙහෙර කරවා
මනහරා
තෙ දි න් දිවයුරු ලෙසින් බැබළී ලෝසඳුන්
දුක’දුරු හැරා

27. මෙලෙස තෙදබල මහත් අණසක ඇති රජුන් කුලැ පිවිතුරු
සවුළු විජයබා නිරිඳු පිත් පැරකුම් රජුන්හට මුනුබුරු
ලැමැති ජයමහලැන හිමි සුරතුර වෙළු රන්ලිය යුරු
සුනෙත් මහදෙවි බිසෝ හිමි ලත් රජරුවක් සොඳ බුදුකුරු

28. උතුම් ගුණ යුත් මෙපැරකුම්බා නිරිඳු රයිගම් නම් පුරා
බරණ සුසැට සිද්දවොටුනුත් පැලඳැ විලසින් පුරඳරා
වෙළෙඳ ගොවි කුලවන්නි නිරිඳුන් නොදන කළ නො
සිරිත් වරා
බබුළුවා ලෝසඳුන පැලැඹෙයි සරහමින් කුල දිවයුරා

29. දකුතු මෙනිරිඳු නුවන් ලත් පල ලැබෙයි
සිතුවොත් දුක් ඇරේ
නුමුතු රසබස් ඇසුව දෙලොවැමැ සැපැත්
පැමිණෙයි අරතරේ
දිමුතු යස තෙද නුවණ ගුණ කිව කැමැති යම් දෙය
සිදු කෙරේ
අමුතු බැඳි පද කියම් එබැවින් අසවු වියතිනි සබතුරේ

30. පැහැ දි සරම්බා රැදි මනරම්බා
තුනු සිරි රම් බා පති පිළිබිම්බා
රුපු රජ රම් බා රන මත කුම්බා
දින පැරකුම් බා හිමි තෙවිකුම්බා

31. ර න ගලතළ යුරු පැහැසර පුළුලුර
මෙ න දෙව්රජ ගජ කර දිගු යුගකර
ම න පිනවන පුල් සල් තුරු සිරිබර
දි න කැත්කුල මිණි පැරකුම් නරවර

32. ලක තුන් රට මුළු දඹදිව පිළිබඳ
න රි ඳු න් බිහු කැන් ගුණසුවඳින් සොඳ
අ ව දි න් ගෙනැ යන රන් මිණි මුවරඳ
මෙ ර දු න් සරණත තඹරෙකි මනනඳ

33. සගුණෙන් පුවතර මෙනිරිඳු සසොබා
තිළිණෙන් ජය ගෙන දලලඹ නිලබා
බලයෙන් ගත් ලෙළ විදුලිය සපබා
සොබමන් පදසිරි වැකි රන් සලඹා

34. සිඑ මිණි රජ මොහු දෙවටොර පුවළා
සඑ මිණිබර දැල් ගවසත ලකළා
මුඑ ලොව උසුලන රන්ටැම් යුවළා
ලෙඑ මෙන් දනමන පිනවයි නොවළා

35. දින කර සියරාමිණි සර පුවළා
මින ඉණසැද රළ මුතුපෙණ ඔසළා
ගන වෙරළත ගඟ තිළිණෙන් වතළා
රන වැලිතල වැනි මොහු පුළුලුකුළා

36. පින් සර පැරකුම් නිරිඳුගෙ සිරිමත්
දුන් කොකුමහරා උර මුතුහර යුත්
රන් මෙරගිරි තල මැද පිළිබිඹු පත්
මෙන් තරුවැළ බැබැළිණි සඳරා පත්

37. රතු මිණි නවපලු නිල්මිණි කොළ දර
මුතු මල් පිපි රන රෝනවල පැහැසර
සිතු ලෙස දෙන විතරණ ගුණ පලබර
අතු සිරි ගති මෙනිරිඳු අත සුරතුර

38. මැද ලප වැනි රසඳුන් වැකි යුගනෙත
බද තරුවැළ මිණි අබරණ සවනත
මද හස සඳකැන් පිරි සත නෙත නෙත
සද මඩලෙකි පැරකුම් රජ වුවනත

39. දිය නෙත කුලපති මෙරජුගෙ මනනඳ
සිරි අත රන් දපණෙව් වුවනත සොඳ
සවනත රතු මිණි කැන් රිවිරස් වැද
පැහැ පත නවපුල් පියුමෙකි ඇමසඳ

40. විඳු  ලිය තරසර තුඟු සිරි  ගත
ඉඳු  ඉඳුසැව් සිය ඇත එහි මුඳු  නත
බුඳු  කුරු මෙනිරිඳු රන්කිරුළගග  පත
රුඳු  නවමිණි කැන් එමැ විලසින්  යුත

41. මහ සෙන්  පිරිවර තරු මැද සඳ  යුරු
ගන රන්  රතයට නඟිමින්  විසිතුරු
මෙරදුන්  පැදකුණු වන ලෙස  පුරතුරු
සඳසුන්  වේ මැද පත් වැනි  පුරඳුරු

42. තරිඳු ගුණයෙන් ගැඹරින්  කිරිඳු
කිරිඳු බලයෙන් දිරියෙන්  ගිරිඳු
ගිරිඳු නුවණින් විකුමෙන්  සිරිඳු
සිරිඳු දින පැරකුම්බුජ  නිරිඳු

43. මනරම් සිරිපති සරසවි  රසවත්
ගනගුම් සක් සෙවි වෙරළත තුරු  යුත්
විහිගුම් මින් නද පුන්සඳ  නඳවත්
පැරකුම් රජ සයුරෙකි කගමිණි  ගත්

44. මෙනිරිඳු  සුවිසල් යසසට  දිමුතා
එක බඳු  වන ලෙස පැහැයෙන්  නුමුතා
සරනිඳු  නුසුලා ගජ හස  සතතා
උරගිඳු  විඳු, සෙවි කෙලෙසඳ  තිනෙතා

45. දිය බඳ  සිවුවත කළ තුරු  සෙනෙහස
සිරි සඳ  සරසවි වෙත සමහවැ  වැස
මන නඳ  පැරකුම් හිමි නුබ ගුණ  රැස
කෙලෙසඳ  පරදර පව් දුරු කළ  ලෙස

46. දුල යස පැරකුම් රජ දඹදෙණි  වැසි
කුල වන්නින් මැඩැ තෙද බලයෙන්  නිසි
නිල ලා සිරිලක තැන්පත් කළ  ලෙසි
කැල ඹුණු දිය පැඳූ වැනි  අගතිසි

47. අණ තද මෙනිරිඳු වැකි නොම කාළම
ගුණ සරු අකරන වන් ගන කාළම
බැණ නැඟි නද අසමින් රන් කාළම
රණ දෙරණත නොසැලේ දෝ කාළම

48. බාති ය රජ වන් පැරකුම් දිනරද
ජෝතිය වත සිවුරහ සෙන් රැස් කඳ
ජෝතිය සිටු නරවර ගන'ඳර කඳ
බී ති ය කැරැ ගියෙ[3] පරසක්වළ වැද

49. කිවී කැලන් ඔද යසසින් සුරරද
රි වී කුලෙන් පැවැතෙන පැරකුම් රද
ගැවී සුරත සිරිපා සර මුවරඳ
නිවී තැවුල් සිත ඇපා හසරද

50. පිනිපා වන් පිරිසිඳු යස වතුරු
සියපා තෙද යුත් මෙරජුගේ සොඳුරු
සිරිපා නියරස් ගඟ බැස මහරු
සතපා ගති ගිම් ගංපළ කුමරු

51. ර න් කොඩි මෙන් වැඩි මුළු ලොව පසිඳූ
පි න් දැඩියෙන් වැඩි පැරකුම් නිරි ඳූ
ම න් එඩියෙන් අඩියක් පසු නොවි ඳූ
ක න් නඩි මන් මැඩි විකුමෙන් පුරු ඳූ

52. නෑ රිය ජය මන් පෙර සිටැ පුරුඳූ
වී රි ය බලවිකුමෙන් සරි මිගිඳූ
ආ රි ය සක්විති රජකුල කුමුඳූ
සූ රි ය හිමි දින පැරැකුම් නිරිඳූ

53. ති ර සර පැරකුම් රජ කී මේවර
කැර මුඳුනත සෙන් වැද සොළියා පුර
ව ර කුරුඬයන් මාලවරායර
පැර යූ පැලඹෙන තෙදණින් බාසුර

54. උසුලනු පැනෙනුය දෙරණිඳින් ලියතුරු
මෙනිරිඳු දත් සුරතින් ගත් පිවිතුරු
තිලුපුල් පැහැ යුතු කගලිය නිරතුරු
මිහිකත උසුලා කියලිය විසිතුරු

55. රණහණ වන් රුපු වෙර ලේ දිය ඉ සි
කගලිය මෙරජුගෙ යස මල් පිපි නි සි
එහි රජසිරි පල ගෙනෑ දසදම් රැ සි
සත දදගණ තුටු කෙළෙ මුළු ලෝ වැ සි

56. ගරු තර තරසර දිරි සරි ගිරිඳුන්
හිරු කුල කිරිසමුදුරු යුරු තරිඳුන්
සරු ගුණ පැරැකුම් රජ සරි සුරිඳුන්
කිරු ළිස පැලැඳවි සොළි පඩි නිරිඳුන්

57. කලදෝ කොඳ කිරණව හස හාරා
ය සදෝ පැරකුම් නිරිඳු උදාරා
න රිඳෝ සඳ රිවිකුල සරු සාරා
බැඳැදෝ මුඳුනත් සිටිති නොවාරා

58. මෙනිරිඳු විකුමන් සිතුවොත් වැරසර
මහමෙර තුඹසෙකි කිඳැලෙකි සමුදුර
සිය දොරැ වැලිමළුවෙකි දඹදිව තර
සෙසු රජ නරපණුවන් කිම බැඳ වෙර

59. මෙරඳුන් තර ගුණ ලබනුව මෙර ගිර
ස රි ඳුන් මුඳුනෙන් උසුලා ඇම වර
අඩකි න් තම තුනු ගැලෙමින්[1] සමුදුර
තව දත් රකිනෙව් සහ ගිරි පිරිවර

60. තු ල් ගජ හය රිය මුතු පට වාසත්
ව ල් විදුනා යුග මිණිවැළ සේසත්
බැල් මෙන් පැරකුම් නිරිඳුගෙ බෝසත්
කල් නොයවා ලැබැ වෙති දන පෝසත්

61. පුරා සතොස් යති සියුරන් ළතරේ
වරා නොපිළිවෙත් පව් ගන අඳරේ
ගුරා ලොවට පැරකුම් නරපවරේ
සරා සඳෙව් හෙබවී සඳුන'ඹරේ

62. මෙ රදු න් සැපතින් පුරඳුරු අයුරු
සතොසින් දෙන නිති මහදන් වතුරු
ව ස මි න් යදි ගහ මනදොළ ඉතුරු
ප ර මි න් වතළේ යස කිරි සයුරු

63. ව ර යස කිරි තලි මොහු පිරිසඳ යෙති
කි ර ණව දිගොව්ලි තුරුවළි උරපති
හ ර ගිර කිඩ සෙලි යති සුර ගජපති
සු ර ගඟ මල් වැලි, මුතුහර තුරු පෙති

64. යු ත් ගෙල වේ පියපතරින් මනරඟ
නත් හර කිරි බිවු සිය කුස තුර ලග
කිත් හැස පැරකුම් නිරිඳුගෙ දියතග
ග ත් තුඩගින් පොකුරකුරෙකි සුරගඟ

65. කල් සොම් ගුණ වැනි සඳ හිම සඳනෝ
මුල් මෙලකට පැරකුම් රජ නඳනෝ
හල් පිලි නොවැරුද දනැ මුනි වදනෝ
සිල් මිණි ලා රකි තම හිද නිදනෝ

66. සි ය කුල රිවි මෙන් කල් දෙස් පිළිවෙළ
පැය කිත් පැයකට විමසා දවසළ
පි ය කර පැරකුම් නිරිඳුට සතසළ
කි ය සරි කවුරුද මුළු තුන්ලෝ තුළ

67. මනරම් සිරි පැරකුම් නර වරණෝ
ඉවැසුම් ගුණයට සත පිය කරණෝ
පව්කම් කළ සතහට වන උරණෝ
යළිකුම් සරි වෙද පුවතර දෙරණෝ

68. මුනිගුණ සැලකුම් සිතැ පා නොවැකුම්
කළ නිති නොතැකුම් විකුමෙනි තෙවිකුම්
තිළිණෙන් සුරකුම් ලක නැව සරි කුම්
අගරජ පැරකුම් දින පෑ පැරකුම්

69. රඳැවූ වෙත සරසවි කමලම්බා
මෙනිරිඳුතුම් නම සිරි පැරකුම්බා
සඳහන් කළ සතහට බැති පෙම්බා
ලැබෙනුය ලොවැ ඇති සව්සිරි එම්බා

70. තෙද ති රුදුරු රුපුනෙඩි මැඩි විපුල විකුම් නාරායණ
යු ව ති නයන මන පිනවන රුසිරු තෙනය නාරායණ
නැණැති තියුණු හසළ නොඑක සතර වේද නාරායණ
ප ව ති සසිරි පැරකුම්බුජ රාජ රාජ නාරායණ

71. ර න මිණි මුතු පඬුරු ලබන රටින් ලාඩ ගවුඩ වංග
තැන තැන වනවිල් වැද රැදි තුඩවැඩි රුපු මැඩි බුජංග
දි න මිණිකුල විජය නිරිඳු පරපුරෙනා පුර කලිංග
දි න පැරකුම්බුජ රජ හිමි රාජවේශ්‍යා බුජංග

72. කිරු එ සමහ දෙවිඳු විලස සැදි සුසැට බරණ රත්න
නැබු එ මෙසිරිලක තුබගබ බබළන නව නවෝරත්න
ස වු එ ලකළ දඹදෙණිපුර පැරකුම්බුජ රාජරත්න
මෙමු එ ලොවට පුවතර විය වීරරාජ සිරෝරත්න

73. ග ජ පති හයපති නරපති රජුනෙඩි මැඩගත් කටාර
බු ජ බල යස චතුරු උතුරු කළ සක්වළිනුත් පිටාර
ර ජ නිය මුනිබණ වියරණ කවිනළු සරසවි කොටාර
වැජ ඕ මෙරජු තුති පුවතර කපට රාජතුරු කුටාර

74. දි න කරකුල පුල් සියපත විල සරදන මෙන රන්හස
ගෙන මුදුනත තබන ලෙසට කළ නිරිඳුන් තම සන්හස
ම න මිණි සිතු සුරබිදෙනු කළඹ සදිසි තිළිණෙන් තොසස
දි න පැරකුම්බුජ බුපති ලෝබිරාජ ගජ අංකුස

75. සිප විරුසිරි තුති කියවන වීර තුල දනංජයා
ලප නැති සඳ කොඳ නඳ කැරැ යස සොඳ ලත් රණංජයා
ඔප වැඩි රුව මදන සදිසි විතරණ තන හසංජයා
අප පැරකුම් නරනිඳු දින දනුරුවේද දනංජයා.

76. විමල උබය රිවිකුල මිණි අකිල බුවන රාජ රාජ
උදුල ලකුණු ගරුඩවේග හයාරෝහ නකුල රාජ
සකල කලා වල්ලබ ගුණ සාහිත සත බෝජ රාජ
පබල විකුම් පැරකුම් රජ ගජාරෝග වංග රාජ

77. පැනය කියන විසඳන කලැ මිළිඳු නිරිඳු සදිසි වාද
විනය සුතබිදම් සසමය තකුසත දිත්නාග පාද
සනය විකුම් පැරකුම්බා නිරිඳු කිඳුරු මදුරු නාද
විනය විතත වසුමතිපති මවුලිමාල සුරබි පාද

78. ගෙන කගපත සහදෙව් ලෙස රණ වැද කිසි නොවන බීත
වන පිළිමල් රජ කල් පුල් කමල් විලට කුහින පාත
රන මිණි මුතු පට්ටවස්ත්‍ර විතරණ ගුණ පාරිජාත
දින පැරකුම්බාහු නිරිඳු දසරත රම කුලබි ජාත

79. මුනි රද අප වදහළ ලෙස කළ තිපිටක තෙපල පාට
කළ බඳ තුඟු ගිජිඳුන් ලා බිදි කන්නඩ්පුර කපාට
මනන ද මිණිබරණ ලකළ පැරකුම් රජ හේම පාට
වගු බිඳ රණදරණී මුකර වයිරිරාජ කුල විපාට

80. ගුණ කරුණාකර සරණාගත සත සිවිරාජ දේව
රණ අසුරන් මැඩැ ජය ගත් කුලයෙන් ආ බාහු දේව
අණ සක්විති බාසලමේවන් පැරකුම්බාහු දේව
නැණ බල පැ සැප සේ ඉඳු විලසින් මින්රාජ දේව

81. වන් මෙදෙන් යුද අන් රදුන් රඹරන් තැළුම්
මදමත් ගජාණෙනි
පුන් සඳින් සඳකැන් ලෙසින් බට පුන් යසින්
රගු රම් රජාණෙනි
රන් කඳින් කළ මෙන් රුවින් රසඳුන් ළඳුන්
නෙතැ මින්දජාණෙනි
නන් සිරින් විඳ මන් තොසින් ඉඳු පින් උතුම්
පැරකුම් රජාණෙනි

82. පැවිකු ම් බල කුම්බකන් බිඳි රම් උවම් යුද
ජය දජාණෙනි
බානු හිම් කැරූ නම්ද ගම් දෙන කම් තරම්
දැනැ මනු රජාණෙනි
ලූ කොකු ම් නිවැකුම් ඇකුම් කළ රම් කමල් තන
යුග බුජාණෙනි
ලෝ රැකු ම් පැරකුම් උතුම් පැරකුම් නමින් දින
මහරජාණෙනි

83. මත්සරා කරගත් සරා ලෙස නෙත් සරා යුතු
රූ සරාණෙනි
පත්සරා සඳ නත් හරා දිසි බිත් සරා දිගු
කිත් සරාණෙනි
අත් සරා යදි සිත් පුරා දෙන කැත් සරා
පැරකුම් සරාණෙනි
සත් උරා තල මුත්හරා ලෙස මෙත් පුරා ඉඳු
ලක් සරාණෙනි

84. පත් ම අත් කුල කැත් දිමුත් හර පත් පදත්
වර රත්නවත්තම
රත් නෙතත් දිගු අ ත් යුගත් පැහැපත් ගතත්
යහපත් සෙ සිත්තම
පත් ම වත් වත ප ත් මහත් සිරි යුත් පසත්
පැරකුම් රජුත්තම
සිත් සැපැත් ලැබැ ස ත් තොසත් කරූ සිත්මිණෙව්
පවතින්න නිත්තම

85. මූද සේ නැණ වාදයෙන් දිනු වේදයෙන් ගුරු සේ සුරාදිප
යෝද්ද සේ බල වීර වික්මැති දීර වූ ගුණ බුදරාදිප
සාදනු නිරිඳුන් මුදුන් දුන් පාද යුත් අනුරාපුරාදිප
නාද ගී යස ලෝ පුරා සැප සේ ඉදින් පැරකුම් නරාදිප

86. අංග මංගජ මංගලෙන් වැඩි බිංග මෙන් මුනිපා
කමල් වට
අංග තුංග මතංගජන් දෙන ඉංගකින් කවි
බන්දනන් හට
අංග වංග කලිංගහිංගුල කොංගණෙන් පැවැසූ
යසින් තුට
අංග සංග වලංග වෙන් සිරිසංගබෝ පැරකුම්
රජුන් හට

87. ඇස් සහස් සිරි ලෙස් නිවෙස් තරු රැස් පිරිස්
පාබළ යසස් ඇති
දෙස් වෙසෙස් දැසි දස් ගවස් දෙන තිස් සපස් සූ
බරණ රැස් තිති
වස් නිදොස් කිවි හස්ත හස් පත විස්ම බස්
පැවැසුම් සරස්වති
රස් සහස් දෙන රස් නිදොස් කෙළෙ තොස්
උසස් පැරකුම් ගජස්පති

88. අ ග රජ හිමි පැරකුම්බා නරපවර
දි ග සක්වළ හිමි පැලඹෙත තෙද පතර
ළහ වෙවුලා වනගබ දිවයුරු තිසර
සැහ විණී වළඹ දහරණ සමුදුර වතුර

89. පැ රැ කුම් දෙරණිසුරු පරසිදු තෙද යසස
වි හ ගු ම් විදි සතර සිලිලාර පැන් රැස
ම න ර ම් තියුණු නැණ දොහොතින් රැගෙනැ ඉස
නොතරම් තරම් දති වියතුන් කියන බස

90. නඳ දෙන ලෙව් නුවන් නවසඳ කලාවන්
දෙන තිළිණෙන් සිවුදිවි වැසි වලාවන්
මුනිබණ කෙසර තෙල් යුතු රන මලාවන්
දන ගති මෙ හිමි ලොවැ සුසැට කලාවන්

91. අරුණු සරණ තල ගජ වන් ගමන් යුතු
කමල් කල් වුවන් රස පිය බස් නුමුතු
විදුරවි නුවණ සොමි ගුණ මෙනිරිඳු දිමුතු
සව් දෙව් රුසිරි එක තැනැ මැවූ වැනි අමුතු

92. හෙසඳ! කිම මුහුද! කිම සැහවෙනු වෙලත
මෙ ගජ හය අතින් පැරකුම් රජ දිමුත
දෙයි ගිජිඳුන්, ඔහු මදහස කැරැ ලවත
තදුන් කැලුම් සොමි ගුණ යුතු පඩුරු ඇත

93. රද කෙසරිඳු පැරකුම් නිරිඳු උදයග
බඳ සේසත් සඳ මුතුලැල් තරු සමග
වැඳැ ඉඳිනා හැම නිරිඳුන් පැදුම් දිග
සොඳ කරතල සියපත් හැකිළිමෙක රග

94. ල ක සු රු සුරතැ ලෙළ කගපත වලාකුළේ
න ර තු රු නැහෙත එවිගස පැළදිගින් වෙළේ
අ මි තු රු නිරිඳු අහනන් කොමළ උරතලේ
පියොවුරු තිසර මුතුහර නෙළුඹුදළි හළේ

95. දකැ හිමසෙලැ ඇත් සිහරද උතුරු දස
එහි සිදහන වෙන වෙන ගාති මේ ලෙස
පැරකුම් රජුට සරි නිරිදෙක් තිලෝ කුස
ඔහු රුවමැයි පිළිබිඹු පත් දපණ පස

96. මෙර පත්හිදට හැරගෙන ගුවන තල්පත
ලියූ තිවට කළු මැද සයුර තෙලියත
පවසත අනත මෙනිරිඳු ගුණ නැණ අනත
කිසි අඩු නොවෙයි එවනත කෙවියත සමත

97. මි හි ප ල් පැරකුම් රජ මිණි
ර නො විල් ගුණ සවන පැමිණි
ළ ද ක ල් නිරිඳුන් පිළියැණි
නි ලි පු ල් සවනින් ගිළිහිණි

98. මෙරජුගෙ කග සිලිල් පොවත
වගළි සිලිල් රුපඹුව නෙත
එමෙ කග සුරතින් ලෙළවත
ලෙළ දුනි සුරඹුව වම් නෙත

99. සිරි සරසවි සහ පුරුදු
සිරි පැරකුම් මෙනරනිඳු
යස ගී අසමින් සුරිඳු
කෙළෙ සඳහන් නත උරිඳු

100. පැරකුම් නිරිඳු සඳ
බලත් රුසිරි මනනඳ
සියලඟ නිසල සොඳ
නුවන් වී නම් යෙහෙකි ඇම සඳ

101. සවන්තැටියෙන් බොත
මොහු පියබස් අමා ඇත
බමා රනමෙර මත
කුමට ඇළලුද සුරෝ සයුරත

102. පිනිදිය සඳුන් රස
කුමට මුතුහර සඳරස
පැරකුම් රජ වෙසෙස
පවති සිරිපා සෙවණ සිහිලස

103. ඉසුරුද සුරලොවට
සක්විති සැපැත් මුළු රට
නිවන් සුව ලද තුට
සදිසි වේදෝ මෙරජ බැල්මට

104. නුවණ සුරගුරු බඳු
ගුණයෙන් සදිසි සොම් සඳු
සැපතින් සරි සුරිඳු
වැඩෙකි සීනෙන් දුටත් මෙනිරිඳු

105. සත් අ ත සිරි පති දිනිඳු තියම්බා
වත් අ ත සිරි සඳ මෙසුර කඳ ම්බා
පත් ම ත සිරි සිලි ගන දුනුකු ම්බා
දෙත් සෙ ත සිරි නිරිඳුට පැරකු ම්බා

106. තෙවිකු ම් විකුමෙන් බැසැ ර ණ දෙරණා
නොතැකුම් කළ රුපු නිසරණ ස ර ණා
ස ඊ කු ම් කළ ලොව තිසරණ බ ර ණා
පැ ර කු ම් රජ දින අසරණ ස ර ණා

107. අප පැර කුම් රජ යස පැලැඹෙත නිති
උ ර හ ර නිල්ගෙලෙ යන නම නොපවති
හ ම ක ර නිකැළැල සප්කුලපති පති
රුපුන ර පති මෙන් කිතයුග සිරි ගති

108. පුවත ර රම් බා විරිඳු තරම්බා
මනහ ර රම් බා පති පිළිබිම්බා
යසහ ර ලම් බා උර දිගු නම්බා
දිනපැර කුම්බා රජ සිරි රම්බා

109. රුපු බි ඳු මට පිහිටවැ සිටි සඳරා
රඳු උදු ගුණ දිනවන යස පතරා
වැඩ සි ඳු කැඊ සෙවුනා අත් නොහැරා
මෙනිරි ඳු කග අගමැතිඳකු අයුරා

110. මුනිස ර ණ තඹර මී පා මීපා
පුවත ර සිරිලක් දී පා දීපා
කමස ර දෙවිඳු සරූපා රූපා
දිනපැ ර කුම් බුජ බූ පා බූපා

111. ග න ස ර යුරු යස කිරණා කිරණා
වෙන න ර පති මත වරණා වරණා
ම න හ ර විරුසිරි සරණා සරණා
දින පැ ර කුම් බුජ නරණා නරණා

112. ය ස සැති පැරකුම් නිරිඳුගෙ දියනෙත
ස ස ලැසි පියැ වක් බැව් බැම යුග රත
ස ස ලා රුඳු මුදු බැමයුග පැහැපත
නි ස නේහස ඇත දීමෙහි වෙන නැත

113. කිරිසිඳු අගතිසි එකැදිලියෙන් ගත් වර වියැළුණු කල
සිරිසඳු තම සුළැහිලි නියැතුළට පිවිසැ සැහැවුණු කල
පරසඳු පැරකුම් නිරිඳුගෙ වැජැඹෙන දසදෙස හැම කල
පිරිසඳු යසසට සරි කොට උවමක් පවසනුය කිකල

114. පෙර දිගුපති කිඳසිඳු රද ඉඳුරු පැදුමැ සිවුදිගු පති
එ ර වණ නම් ඇතෙකි ඔහුට මෙරජුට ගජසෙනහෙක් ඇති
පෙර සුර රණ දිනි එසුරිඳු මෙනිරිඳු සුරරණ ජය ගති
සු ර රද මෙහැමින් අප පැරකුම් නරනිඳුහට සරි නැති

115. 'අල්ප දෙයක් නොදෙමැ' යි යන තුතිගොස
පළ කැරැ දියතුරු
සිල්ප නිපුණ පැරැකුම් රජ රජසැපතට පැමිණෙන තුරු
කල්ප තුරැයි පසිඳු මදාරා පරසතු සිතු සුරතුරු
කල්ප සු කැරැ සිටිති සිතෙයි ලෙව්සත
තුටු කැරැ නිරතුරු

116. කි ය ග මැහිය එනු කොහි සිටැ? දද සමනොළ ගොසිනා
නොය කියමුතු එදිගැ බමුණ සුමන සුරිඳු විසිනා
ගි ය කල දෙදහස් පන්සිය රජකු එතැයි දියනා
කි ය විය තන්වැසිය එනම් පැරැකුම් රජ මෙදිනා

117. මත හ නැඟුමට සදිසි වසුදෙව්, සියලු දුනුසිප්
දොණැදුරාමය
තුර හ නැඟුමට නකුල රද, කග සිපට සහදෙව්, පරසුරාමය
සම හ සිවු සැට සිපට විකුමට, යොවුන් රුසිරට
රම්සුරාමය
මෙර හ සරි කොට පසිඳු තිරිදෙක් මෙකලැ
පැරැකුම් ලකිසුරාමය

118. විත්ත බේ රී විජය දළහන් පුම්බමින් සක් මෙලක් දීපා
නිත්ත වේ රී රජුන් සිතැ බිය ගන්වමින් දක්වා පතාපා
මත්ත හා රී තුරඟ නැඟි ලෙස පවර පැරකුම්බාහු බූපා
සත්ත නා රී තුරඟ නැඟි පෙර නවයොවුන් මන්මද සරුපා

119. සබඳ දෙරණ ගන දරුමෙහි නත පණිපති පුන්දරා
සරද සමය උදිත නිමල හිමකර යසැති සුන්දරා
සමද වයිරි රාජ සමර ජලනිදි මතන මන්දරා
සැරද පවර පැරකුම්බුජ රජ මුනිපුද පුරන්දරා

120. පිරිවර ගජ හය රිය මහසෙන් ගෙනැ රණමුක අබීත
දිරිත ර බුජබල විරිදුන් ජය ගත් විලසින් විනීත
සිරිකර තල තඹර නිවෙස් කළ දිනකර කුලබිජාත
සිරිබර පැරැකුම් රජ දින පට්ටවස්ත්‍ර පාරිජාත

121. වෙන වෙන කවිනළු අවිසිප් සකල කලා දනැ විබාග
පින වන කිවිදන මනදන කනකදාන කාල මේග
තැන තැන රණ දරණී මුකර වයිරි රාජ කමල නාග
දින දින කරකුල පැරකුම්බුජ රජ අනවරණ තැග

122. විහිඟුම් රජ නිකර කිරණ කිරණ තරඟ ගගන ගංග[1]
මනරම් නිජ යසිනලු කළ සිරිලක රිවිකුලෙනි තුංග
පැරකුම් බුජ බල විකුමැති යුවති නයන රුසිතරංග
පැරැකුම් බුජ රජ දින පරරාජවේශ්‍යා බුජංග

123. වැර සැර රම් බුජ විකුමැති පරනිරිඳුන් නොවන සාද
සර සැර හුම් කළ මිණිමුතු තඹර සදිසි සුරබි පාද
සරපු ර හිමි කැරූ පුවතර සිරිසර තුති ගීත නාද
වර පැ ර කුම් බුජ රජ දින නවමිණි විතරණ විනෝද

124. වර රම්බා පුර හරිගිරි කිරිසිඳු හිම යසස් හාර
උර ලම්බා දසදිගහන, මනමණි විතරණිනුදාර
දෙරණම්බා කුලහන කැරූ පුවතර වර ජගත්වීර
පැරූකුම්බා නරනිඳු දින අබිනව මදනාවතාර

125. පතහ කුලෙන් පැමිණි මෙපැරකුම් නරනිඳු
දෙරණුසුලත
උනහ අනත දෙසෙයි බැලුම් ලිය පියවුරු
කිවිඳුන් වෙත
වළහ ගැනුම්නෙන් සෙනෙහස තුරා යුදෙහි ලිය පියනත
බුජහ සසග වීමෙක් හර පුළුලුර මඩලෙහි වෙන නැත

126. ඉඳු නිල් රුවනි න් දිලි රන් කිරුළින් දෙසවන්
කොඩොලින් සුලඹේ
උර මල් යුවළි න් ගෙලෙ රන් ලකරින් බුජ
මින්වළයෙන් සසොබේ
ම ත දල් මෙවුලි න් දහ මින් පතරින් පදපංකජ
රන්සලඹේ
මෙසියල් බරණි න් පැරකුම් රජ දන් ලකැ
සක්රජු මෙන් වැජැඹේ

127. හිම රසින් කිරිසිඳු ලෙසින් දිලි කුල විසින් මිණිදීපනෝ
කලුනැසින් රසඳුන් ලෙසින් පන්සර වෙසින් තුනුරූපනෝ
සනහ සින් මුසු රස බසින් ලැබුණොත් තොසින්
අද බූපනෝ
සහරොසින් මදරජු වි සි න් මතු සරපසින් වන තාපනෝ

128. ව න් නිල් ගෙලෙ නිල් රල් වරලින් තුල් බිඟු දැල්ලා
ව න් පුන්සඳ මෙන් රන් තඹරින් පුල් වතැ දුල්ලා
කන් වැල් විදු සැල්මෙන් මිණි කැල්මෙන් ගත නිල්ලා
සු න් දර පැරකුම් රජ දිගු බැල්මෙන් සිත ලොල්ලා

129. බ න් දා මින්දද මද අරවින්දා සර ලා සරයානෝ
ම න් දා නිල තුරහට නැහෙමින් දා වියොවග නංවානෝ
ච න් දා නල ලෙස විය නෙතැ නින්දා නොලදිම් තනි යානෝ
කැන්දා වරෙ පැරකුම් නරනින්දා සකිසඳ සඳපානෝ

130. වීර සේ ර සොළි පාඩින් ලූ අණ දූපනෝ
තාර හාර හර ගිරි යසසැති පරතාපනෝ
නෑර වාර ඝන නයනඳනා තුනුරූපනෝ
වීර ප ර ක්කමබාහු බානුකුල දීපනෝ

131. මි න් න ර සී කඳුබ් කුරු ඈ වෙස් ගෙනැර
මෙන් කැරැ නළ විසූවයි උවිඳුගෙන් හැර
පි න් ස ර එක වෙසෙයි සිටි බුජ විකුම් සර
දැ න් පැ ර කුම් නිරිඳු වෙත විසි සිරි නිතොර

132. දි ව යුරුකුල කමලකර දසසියකිරණ
පු ව තර මෙසිරි ලක පැරකුම් නරවරණ
ලොව කිවි සත සතොස රැරු දෙවත විතරණ
න ව මිණි නිති බියෙන් සැඟවුණු වැනි දෙරණ

133. ප බ ඳ රැඳුණු පැරකුම් රජ බුජ මැඳුර
මෙ සඳ හස දිගැස වෙසඟනඳ එක යුර
ව ල ඳ ත මෙරජ සුරතින් තුටුවැ තම කර
වැලැ ඳ ගනි නිබඳ පර නරනිඳුන් කර

134. ද ද මුතුලැල් සිසිබිම්බා කුඩ නහමින් දිගු යටගේ
බැඳ මින්දද නුබ ලම්බා දික්විජයට ගෙනැ සෙනගේ
නද කෝකිල සක් පුම්බා මලවිය නල අඳුට නැගේ
අ ද නරනිඳු පැරැකුම්බා නොලැගෙනු කිම වරද මගේ

135. කොඳ මල් මුවරඳ රස බෝ බිඟු වැද පුල් කුමුදු වෙනේ
ම ද මත් කොවුලන් නද බෝ යකු හඬ දෝ[2] දන් නොදැනේ
සොඳ රිවි කුල සිරිසඟබෝ සිරි පැරකුම් නරනිඳුනේ
නොඳ නෙයි සකිසඳ එන බෝ පෙරමඟ බැලුමෙන් නිදිනේ

136. දු න් තුනු විමනත කදපා තුඟු ගහනත මිණි දීපා
ව න් රසඳුන් නුවන ලපා වත සොමි පුන්සඳ සෙ ඔපා
බ න් මිණි නූපුර සිරිපා සිරි පැරකුම්බාහු නූපා
ද න් දකැ දකැ ඉන්ට සැපා වී නම් එමෙ වේයැ සැපා

137. පි රි සුදු මුනිදහම් තතු සමඟ සසමය
පි රි සිඳැ ඉගෙනැ ඇත් අස් සියලු සරමය
දි රි බල විකුම් නුවණින් පසිඳු මෙසමය
න රි දෙක් නම් මෙකලපැරකුම් නිරිඳු මය

138. උ ද හ ස් ගුණය දනැ පැරකුම් නරනිඳුගේ
එ ද ව ස් පටන් මද යුදයට නලදුනැගේ
සඳ ර ස් හිමසඳුන් සිහිලසය යුගතගේ
සෙද ගො ස් මෙතතු කිය සකි නරනිඳුට මගේ

139. කුන් දා කර වැද නද දෙයි මත මීපා
මන් දා නිල නල ලෙස කෙරෙ තුනු තාපා
ඇන් දා ලෙස සිතැ සිතෙනුයැ තුනු රූපා
කැනදා වරෙ මවෙත පැරකුම්බුජ භූපා

140. සිරි දියර ම් රජ මෙන් පැලැඳැ කිරුළිස
සිරිලක හි ම් රජකුල සිරි යෙහෙන් වැස
සිරිපද අ ම් බුජ සිරිහට කැරැ නිවෙස
සිරි පැරකු ම් රජ දින පස්වා දහස

*
**